දුරකථන / தொலைபேசிகள் / Telephones

සභාපති / தலைவர் / Chairman } +94 11 2325559

උප සභාපති / உப தலைவர் / Vice Chairman } +94 11 2451910

කළමණාකාර අධ්‍යක්‍ෂ / முகாமைப் பணிப்பாளர் / Managing Director } +94 11 2323213

පොදු / பொது / General } +94 11 2421231 / +94 11 2421201

# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
# இலங்கைத் துறைமுக அதிகாரசபை
# SRI LANKA PORTS AUTHORITY

විදුලි පණිවුඩ / தந்தி / Telegrams } "ලංකා වරාය" "இலங்கைத்துறை" "PORTSLANKA"

ෆැක්ස් / பக்ஸ் / Fax } +94 11 2440651

E-mail : chairman@slpa.lk
Web site : http://www.slpa.lk

අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01, ශ්‍රී ලංකා
இல.19, சைத்திய றோட், கொழும்பு 01, இலங்கை
No. 19, Chaithya Road, Colombo 1, Sri Lanka

තැ.පෙ.අංකය / த.பெ.இல. / P.O. Box No. } 595

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........

මගේ අංකය / எனது இல. / My No. } ..........

දිනය / திகதி / Date } 2016.01.06

අධ්‍යක්‍ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කර්තෘතුමා,

මහත්මයාණෙනි,

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් නිකුත් කරන පහත සඳහන් ප්‍රවෘත්තියට ඔබතුමාගේ අවධානය යොමු කර, අවශ්‍ය ප්‍රචාරය ලබා දෙන්නේ නම් අතිශය කෘතඥ වෙමි.

..............................
නලින් අපොන්සු
නියෝජ්‍ය ප්‍රධාන කළමණාකරු
සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය

---

**<u>ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදනය අංශයේ ප්‍රධානී කාර්යාලයට සීල් තබා ඇති බවට ඇතැම් මාධ්‍ය කළ ප්‍රචාර සම්පූර්ණයෙන්ම අසත්‍ය බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය අවධාරණය කරයි.</u>**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදනය අංශයේ ප්‍රධානී කාර්යාලයට සීල් තබා ඇති බවට ඇතැම් මාධ්‍ය කළ ප්‍රචාර සම්පූර්ණයෙන්ම අසත්‍ය බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය අවධාරණය කරයි. මේ වන විට හම්බන්තොට වරායට වතුර පිරවීමේ ජාතික උත්සවයේදී සිදුව ඇතැයි පවසන මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විමර්ශනයක් ආරම්භ කර ඇත. එම විමර්ශනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ ලිපිලේඛනවල පිටපත්ද ඇතුළත්ව අසා ඇති ප්‍රශ්නවලට විස්තරාත්මක පිළිතුරු සහිත සම්පූර්ණ වාර්තාවක් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට ලබා දෙන ලෙසට එහි ලේකම් ලැසිල් ද සිල්වා මහතාගේ නියමය පරිදි වරාය සහ නාවික අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට දැනුම් දෙන ලදි.

එකී දැනුම් දීම පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැකසූ වාර්තාව ඊයේ පස්වරුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති දම්මික රණතුංග මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් විශේෂ කමිටුවකින් නැවත අධ්‍යයන කෙරිණ. එහිදී අනාවරණය වූයේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විමසූ ප්‍රශ්න සඳහා ප්‍රමාණවත් පිළිතුරු සහ ලිපි ලේඛන එකී වාර්තාවට ඇතුළත් නොමැති බවයි. මේ හේතුවෙන් නැවත වාර්තාව සකසන ලෙසත් සියලු ලේඛන සහ සත්‍ය තොරතුරු පමණක් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට ලබා දෙන ලෙසටත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති දම්මික රණතුංග මැතිතුමා ඉහළ නිලධාරීන්ට උපදෙස් දුණි.

කෙසේවෙතත් එම උත්වයට අදාල වැදගත් ලිපි ලේඛන සහ තොරතුරු අස්ථාන ගත වීමේ හැකියාවද මෙම කමිටු රැස්වීමේදී සාකච්ඡා විය. කමිටු රැස්වීමට එක් වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය අධ්‍යක්ෂවරිය පෙන්වා දුන්නේ හම්බන්තොට වරායට වතුර පිරවීමේ ජාතික උත්සවයේ ප්‍රවර්ධන

කාර්යයන් සහ කලාත්මක නිර්මාණ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන සහ මහජන සම්බන්ධතා කොට්ඨාසය මගින් සිදු කළ බවයි. ඒ සඳහා ටෙන්ඩර් ක්‍රියාවලියක් අනුමගනය කර නැතැයිද මූල්‍ය අධ්‍යක්ෂවරිය තහවුරු කළේය. එමෙන්ම හම්බන්තොට වරායට වතුර පිරවීමේ ජාතික උත්සවයේ මූල්‍ය පරිහණය සම්බන්ධව අභ්‍යන්තර විගණනයක් හෝ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණනයක් හෝ කර ඇත්දැයි ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවද විමසා තිබේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉහළ කළමනාකාරීත්වය සන්නිවේදන සහ මහජන සම්බන්ධතා කොට්ඨාසයේ මූල්‍ය භාවිතය ගැන අභ්‍යන්තර විගණනයක් කිරීමට අදාල අංශ වෙත උපදෙස් ලබා දුණි. හම්බන්තොට වරායට වතුර පිරවීමේ ජාතික උත්සවය සම්බන්ධ වැදගත් ලිපිලේඛන එම කොට්ඨාසයේ තැම්පත් කර ඇති බැවින් අදාල සියලු ලේඛන තමන් භාරයට ගන්නා ලෙසද අභ්‍යන්තර විගණන අංශයට උපදෙස් දුණි. මේ වන විටත් එම ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. ඒ හැරෙන්නට ඇතැම් මාධ්‍ය වාර්තා කළ පරිදි වෙනත් කිසිදු සිදුවීමක් නොවූ බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වගකීමෙන් දැනුම් දෙයි. එමෙන්ම ඇතැම් පුද්ගලයින් ලබා දුන් විවිධ ප්‍රකාශ සත්‍යයෙන් තොර බවද අවධාරණය කෙරේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන සත්‍ය තොරතුරු මහජනතාවට ලබා දෙන මෙන මෙන් ඔබ මාධ්‍ය ආයතනයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.